# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2012/43 - 2017 මාර්තු මස 31 වැනි සිකුරාදා - 2017.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**උතුරු මැද පළාතේ පළාත් සභාව**

2016 අංක 02 දරන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 2017 මාර්තු මස 13 වැනි දින උතුරු මැද පළාතේ පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

එච්. එල්. එස්. විජේසිංහ,
ලේකම්,
උතුරු මැද පළාත් සභාව.

2017 මාර්තු මස 21 වැනි දින,
උතුරු මැද පළාත් සභාවේ දී ය.

**2016 අංක 02 දරන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය**

2016 අංක 02 දරන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය 2016 නොවැම්බර් මස 29 වැනි දින පැවැත්වූ උතුරු මැද පළාතේ පළාත් සභා රැස්වීමේදී සම්මත වූ බව මෙයින් සහතික කරමි.

ටී. එම්. ආර්. සිරිපාල,
සභාපති,
උතුරු මැද පළාත් සභාව.

2017 පෙබරවාරි මස 16 වැනි දින.

වර්ෂ 2017ක් වූ මාර්තු මස 13 වැනි දින මා විසින් සහතිකය සටහන් කරන ලදී.

පී. බී. දිසානායක,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

**උතුරු මැද පළාත් 2016 අංක 02 දරන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය**

ප්‍රධාන අමාත්‍යාංශය
උතුරු මැද පළාත


1A PG 3477 — 107 (03/2017)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උතුරු මැද පළාතේ පළාත් සභාවේ 2016 අංක 02 දරන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය**

උතුරු මැද පළාතේ පළාත් සභාවට අයත් සියළුම මාර්ග ජාතික මාර්ග පද්ධතිය හා ග්‍රාමීය මාර්ග ජාලය සමඟ ක්‍රමවත්ව සම්බන්ධීකරණය වූ වැඩිදියුණු වූ මාර්ග පද්ධතියක් වශයෙන් ඉහළම ගුණාත්මක භාගයක් සඳහා මනා නඩත්තුවකින් පවත්වාගෙන යාමටත් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා උපදේශන සේවා සපයාදීමත් ඇතුළු සියළුම සේවාවන් ක්‍රියාත්මක කිරීම උදෙසා ද උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම උදෙසා උතුරු මැද පළාතේ 1998 අංක 01 දරන පළාත් මාර්ග සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා විධිවිධාන සැළසීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

01. මෙම ප්‍රඥප්තිය 2016 අංක 02 දරන උතුරු මැද පළාතේ මාර්ග සංවර්ධන ප්‍රඥප්තිය ලෙස හඳුන්වන අතර, ආණ්ඩුකාරවරයා විසින් මෙම ප්‍රඥප්තියට අනුමැතිය ලබාදීමෙන් පසු අමාත්‍යවරයා විසින් නියමිත දිනය වශයෙන් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත්කරනු ලබන දිනක සිට වලංගු වන්නේ ය.

දෙපාර්තමේන්තු පිහිටුවීම

02. මෙම ප්‍රඥප්තියෙහි කාර්යය සඳහා (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන) උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලබයි.

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ

03. දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා පත්කරන මෙහි මින් මතු ''අධ්‍යක්ෂක'' යනුවෙන් හඳුන්වනු ලබන උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධ්‍යක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය.

04. අධ්‍යක්ෂක ඇතුළු දෙපාර්තමේන්තුවෙහි කාර්යය මණ්ඩලය තීරණය කිරීම සහ පත් කිරීම ඇතුලු ඊට අනුශාංගික වෙනත් සියළු කාරණා සම්බන්ධයෙන් 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියෙහි විධිවිධාන අදළ වන්නේ ය.

05. අධ්‍යක්ෂක, අමාත්‍යාංශ ලේකම්ගේ සාමාන්‍ය විධානයට හා පරිපාලනයට යටත්ව ක්‍රියා කළ යුතු ය.

06. අධ්‍යක්ෂක වෙත මෙම ප්‍රඥප්තිය යටතේ පවරා ඇති බලතල කිසිවක් අධ්‍යක්ෂක විසින් ලිඛිතව දෙපාර්තමේතුවේ වෙනත් කවර හෝ නිලධාරියෙකු වෙත ලිඛිතව පවරා දිය හැකිය.

දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය

07. දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි වන්නේ ය.

(1) උතුරු මැද පළාත ඇතුළත පළාත් සභාව යටතට ගැනිය හැකි මාර්ග සැළසුම් කිරීම, හඳුනාගැනීම, ප්‍රකාශයට පත් කිරීම හා ලේඛනගත කිරීම,

(2) ප්‍රාග්ධන ආයෝජන සැළසුම් ද ඇතුළුව උතුරු මැද පළාත තුළ සභාවට ගැනිය හැකි මාර්ග සංවර්ධන සැළසුම් සකස් කොට අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් ක්‍රියාත්මක කිරීම.

(3) ජාතික මාර්ග පද්ධතිය හා ග්‍රාමීය මාර්ග ජාලය සමඟ ක්‍රමවත්ව සම්බන්ධ වන අයුරින් විධිමත් සංවර්ධිත මාර්ග පද්ධතියක් වශයෙන් පළාත් සභාව යටතේ වන මාර්ග නඩත්තු කර පවත්වා ගැනීම, එසේ පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා වෙනත් උපදේශනය ලබා දීම හා නියාමනයට අදළ කොන්දේසි හා ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම.

මාර්ග සංවර්ධනය ප්‍රකාශයට පත් කිරීම

08. (1) උතුරු මැද පළාත තුළ ප්‍රාදේශීය අවශ්‍යතා සහ ක්‍රම සම්පාදනයේ අවශ්‍යතාවයන් ද සැළකිල්ලට ගෙන පළාත තුළ යම් මාර්ගයක් සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම අවස්ථාචෝචිත යැයි මතය වන අවස්ථාවක, එහි මාර්ග පිහිටා ඇති ප්‍රදේශය ''සංවර්ධන ප්‍රදේශයක් '' විය යුතු බවට (වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ වෙනත් යම් අධිකාරයක් වෙත පවරා ඇති බලතල වලට

යටත්ව) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන විධිවිධානයන් මගින් ප්‍රකාශයට පත් කළ හැකිය.

(2) මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමක් සිදු කර ඇති විටකදී එම මාර්ගය අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ආණ්ඩුවේ යම් නියෝජිත ආයතනයක් විසින් හෝ වෙනත් යම් කවර හෝ තැනැත්තකු විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ කවර හෝ සංවර්ධන කටයුත්තක් හෝ වෙනත් කවර හෝ ක්‍රියාවක් නොකල යුතු ය.

පළාත් මාර්ග උපදේශක කමිටුව

09. (1) මෙහි මින්මතු කමිටුව නමින් හඳුන්වන දිස්ත්‍රික් මාර්ග සම්බන්ධීකරණ කමිටුවක් පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන පරිදි ක්‍රියාත්මක විය යුතු ය.

(අ) පළාත නියෝජනය කරන සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

(ආ) පළාත නියෝජනය කරන සියළුම පළාත් සභා මන්ත්‍රීවරුන්

(ඇ) පළාත නියෝජනය කරන සියළුම මහ නගර සභා නගරාධිපතිවරුන්

(ඈ) පළාත නියෝජනය කරන සියළුම නගර සභා ප්‍රාදේශීය සභා සභාපතිවරුන්

(ඉ) පළාතේ ප්‍රධාන ලේකම්

(ඊ) පළාතේ මාර්ග විෂයභාර අමාත්‍යාංශ ලේකම්

(උ) පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය සභා සභාපති, ප්‍රාදේශීය සභා ලේකම්, මහ නගර සභා කොමසාරිස්

(2) උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයා කමිටුවේ සභාපති විය යුතු අතර කමිටුව විසින් කමිටුව සඳහා සම සභාපතිවරයෙකු පත් කර ගත යුතු ය.

(3) අධ්‍යක්ෂ-කමිටුවේ ලේකම් විය යුතු ය.

(4) පළාත සඳහා ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පළාත තුළ පළාත් සභා යටතේ වන මාර්ග පද්ධතිය නඩත්තු කටයුතු සම්බන්ධීකරණය, උපදේශකත්වය, අධීක්ෂණය මෙන්ම පළාත තුළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදළ කවර හෝ යෝජනා නිර්දේශ කිරීම කමිටුවේ කාර්යය වන්නේ ය.

(5) මෙම උප වගන්තිය යටතේ දක්වා ඇති ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය හා නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම යන්නෙන් මාර්ග සංවර්ධන අධිකාරිය උතුරු මැද පළාත් සභාව පළාත් පාලන ආයතන විසින් භාර ගැනීමට ඇති පළාතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන්නා වූ සැලැස්මක් අදහස් වන අතර එය වසර 5ක කාලසීමාවක් ආවරණය වීම සඳහා සකස් කරනු ලැබිය යුතු ය. එසේම එයින් නිශ්චිතව දක්වා ඇති සංවර්ධන හා නඩත්තු කටයුතු ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ප්‍රාග්ධන තොරතුරු ද සඳහන් උපලේඛනයක් ඊට ඇතුළත් විය යුතු ය.

අධ්‍යක්ෂකගේ බලතල

10. මෙම ප්‍රඥප්තියේ සඳහන් වෙනත් විධිවිධානයන්ට යටත්ව ඉහත 8 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත හෝ පළාත් සභා යටතට ගැනිය හැකි මාර්ග සම්බන්ධයෙන් අධ්‍යක්ෂක වෙත පහත සඳහන් බලතල ඇත්තේ ය.

(1) මාර්ග සංවර්ධනය සඳහා වූ සැලසුම් පිළියෙල කිරීම

(2) අමාත්‍යවරයා අනුමත කරන ලද සංවර්ධන වැඩ හා සේවාවන් ක්‍රියාත්මක කිරීම හා නියාමනය.

(3) මාර්ග සම්බන්ධයෙන් මූලධන ආයෝජන සැලසුම් ඇතුළුව පිළියෙල කරන සියළු සංවර්ධන සැලසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

(4) මාර්ගවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ ගිවිසුම් වලට හෝ එකඟතාවයන්ට ශ්‍රී ලංකාව තුළ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අවසර දී ඇති ප්‍රමාණයට ඉන් පිටත යම් තැනැත්තෙකු සමඟ කෙලින්ම හෝ හවුල්කාර ස්වරූපයෙන් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය යටතේ ඇතුළත් වීම.

(5) වෙනත් යම් අධිකාරීත්වයක හෝ ආණ්ඩුවේ යම් නියෝජිත ආයතනයක ඉල්ලීම මත එම අධිකාරිත්වයෙහි හෝ නියෝජිත ආයතනය වෙනුවෙන් අමාත්‍යවරයාගේ පූර්ණ අනුමැතියට යටත්ව මාර්ග සංවර්ධන සැළසුම් පිළියෙල කිරීම, සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක කිරීම, සේවා සැපයීම හෝ ඊට ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් එම ආයතන සමඟ ගිවිසුම් ගත වීම.

(6) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කවර හෝ වරදකට අදාළව මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ චෝදනා පැමිණිලි කිරීම.

මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා පහත සඳහන් කවර හෝ පියවර ගැනීම හෝ එසේ පියවර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකුට හෝ සේවකයෙකුට බලය දීම හෝ අධ්‍යක්ෂක වෙනුවෙන් ගිවිසුම්ගත වී ඇති අයෙකුට අවසර දීම.

(අ) අවශ්‍ය අවස්ථාවන් වලදී ආයුධ, උපකරණ, වාහන හා යන්ත්‍රෝපකරණ සමඟ යම් පවත්නා හෝ අපේක්ෂිත මහා මාර්ගයකට යාබදව හෝ අසළ තිබෙන යම් ඉඩමකට ඇතුළුව, එවැනි යම් මහා මාර්ගයක් සලකුණු කිරීමේ, මැනීමේ, සැදීමේ වැඩ කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරිමේ, එළිපෙහෙළි කිරිමේ, වැඩිදියුණු කිරීමේ හෝ ආවරණය කිරීමේ කාර්යය සඳහා හෝ නැතහොත් ඒ මත පිහිටා ඇති හෝ ඒ හා කවර ආකාරයකින් සම්බන්ධ යම් පාලමක්, වැවක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් තැනීමේ, කැනීමේ, අලුත්වැඩියා කිරීමේ, හැරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ වූ යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(ආ) සියලු යුක්ති සහගත අවස්ථාවල දී අවශ්‍ය සියලු හා නිසි ආයුධ, උපකරණ, වාහන හා යන්ත්‍රෝපකරණ ද ඇතිව, පවත්නා හෝ අපේක්ෂිත මහා මාර්යක් ලකුණු කිරීමේ, මැනීමේ, සැදීමේ වැඩ කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරිමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, එළිපෙහෙළි කිරීමේ වැඩිදියුණු කිරීමේ හෝ ආවරණය කිරීමේ ලා කවර හෝ ආකාරයකින් සහායවීමේ කාර්යය සඳහා නැතහොත් ඒ මත පිහිටා ඇති හෝ ඒ හා කවර ආකාරයකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් තැනීමේ කැණීමේ, අලුත්වැඩියා කිරීමේ, හැරීමේ හෝ වැඩිදියුණු කිරිමේ කාර්යය සඳහා ජලය, දූව, ගල්, බොරළු, සිමෙන්ති හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් රැගෙන යාම සඳහා යම් යාබද දේපලකට ඇතුළුවීම හා එවැනි දෙපලක් උපයෝගී කර ගැනීම.

(ඇ) එසේ වුව ද, අසළ පිහිටා ඇති පාලු ඉඩම්වලින්, නැතහොත් පොදු හෝ අත්හැර ඇති භූමිවලින් පහසු ලෙස ලබා ගත නොහැකි නම් මිස, එවැනි ද්‍රව්‍ය කිසිවක් සඳහා යම් මිදුලක්, නිවසට යන මාවතක්, පිට්ටනියක්, කුඹුරක් ඒ කිසිවක අයිතිකරුගේ කැමැත්තක් නොමැතිව හෝ ඒ සඳහා, යොද ගැනීම නොකළ යුතු ය.

(ඈ) මාර්ගය තැනීම් කටයුතු කිසිවක් ක්‍රියාත්මක කරනු ලබන කාලය තුළදී පාවිච්චි කිරීම පිණිස යම් සුදුසු අතුරු මාර්ගයන් යාබදව පිහිටි හෝ අසල පිහිටි ඉඩම් හරහා තාවකාලික තැනීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ වුවද එවැනි අතුරු මාර්ගයක්, යම් ගොඩනැගිල්ලක් පිහිටා ඇති ඉඩමක් මතු පිටින් තැනහොත් ආවෘත වත්තක් හෝ මිදුලක් මතු පිටින් තැනීම නොකළ යුතු ය.

(ඉ) මාර්ගයක් හෝ යම් මාර්ගයක් උඩින් වැටී ඇති හෝ එහි යම් අවහිරයක් හෝ අන්තරායක් සිදු කරන මාර්ග රක්ෂිත තුළ පිහිටි හෝ පෞද්ගලික ඉඩමක සියලු ගස්, පඳුරු සහ ගස් හෝ ගස්වල කොළ හා අතු හෝ මුල් කැපීම, ඉවත් කිරීම හා යම් යාබදව පිහිටා ඇති සුදුසු ඉඩමකට දැමීම සහ ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් තැනැත්තන්, උපකරණ

සහිතව යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුලු වීම, ලේඛනගත දූවමය වටිනාකමක් ඇති ගස් ඉවත් කිරීම ඊට අදළ අනුමත ආයතනයකට දනුම් දීම හා එම ආයතනය මගින් ඉටුකරවා ගැනීම.

(ඊ) මාර්ගයක අළුත්වැඩියා කටයුතු කිරීම පහසු කිරීම සඳහා හෝ මැතකදී අළුත්වැඩියා කරන ලද මාර්ගයකට අලාභ සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් මාර්ගයකට යාබද දේපලක් මත මාර්ගයට අදළ ඉදිකිරීම් ද්‍රව්‍ය හෝ වාහන හෝ යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාවක් සිදුකරන කාලසීමාට තුළ හෝ ඉන්පසු සාධාරණ කාල සීමාවක් තුළ තැබීමට ඉඩ හැරීම.

(උ) මාර්ග අළුත්වැඩියා නිසි හා යෝග්‍ය තත්ත්වයට පත් කිරීම සඳහා උචිත කාලසීමාවක් විකල්ප මාර්ග පහසුකම් ලබා දෙමින් තාවකාලිකව වසා තැබීම.

11. මෙම ප්‍රඥප්තිය යටතේ කර්තව්‍ය හෝ අධ්‍යක්ෂකගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ රජයේ හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පළාත් පාලන ආයතනයක අයිතිවාසිකම් හෝ කර්තව්‍යයන් කෙරෙහි බලපෑමක් ඇතිවේද ඒ සෑම අවස්ථාවකම එකී අධිකාරිත්වය විමසා අදල කර්තව්‍ය හෝ බලතල ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂකගේ කාර්යය වන්නේ ය.

12. මෙම ප්‍රඥප්තිය යටතේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි යම් නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නිශ්චල දේපළ අත්පත් කර ගැනීම

(අ) එකී දේපළ රජයේ දේපළක් වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ කාර්යය සඳහා එකී දේපළ උතුරු මැද පළාත් සභාව වෙත ලබා දෙන ලෙසට ද,

(ආ) එකී දේපළ පෞද්ගලික දේපළක් වන විට ඉඩම් අත්පත් කිරීමේ පනතේ පියවර යටතේ එකී ඉඩම අත්පත් කර දෙන ලෙසට ද අධ්‍යක්ෂකගේ ඉල්ලීම අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව ඉදිරිපත් විය යුතු ය.

13. (1) මෙම ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමට අදළව පහත සඳහන් කරුණු හෝ ඊට ආනුශාංගික වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් රීති සෑදිය යුතු බව

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති හා කළමනාකරණ කාර්යයන්

(ආ) මාර්ග සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ, පරිපාලනය කිරීමේ බල ප්‍රදේශ, ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් හෝ පළාත් මට්ටමින් තීරණය කිරීම

(ඇ) මාර්ග පද්ධතියට සිදුවන හෝ සිදුකරන තක්සේරු කටයුතු

(ඈ) ප්‍රාදේශීය ඉංජිනේරු බල ප්‍රදේශවල මාර්ග නඩත්තු කළ යුතු ආකාරය

(ඉ) මෙම ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යටතට ගැනිය හැකි කරුණු සම්බන්ධයෙන්

(2) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා සාදන සෑම රීතියක්ම *ගැසට්* පත්‍රය යටතේ පළකරන නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එසේ පත්කිරීමෙන් පසු *ගැසට්* පත්‍රයෙහි සඳහන් දින හෝ එහි සඳහන් ඉදිරි දිනයක සිට එය බලාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා සාදන සෑම රීතියක්ම එය *ගැසට් පත්‍රයෙහි* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා එය පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ පළාත් සභාව අනුමත කිරීමෙන් හෝ සංශෝධන සහිතව අනුමත කිරීමෙන්, පරිච්ඡින්න කිරීමෙන් පසු ඒ බවද *ගැසට්* පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, සංශෝධනය කිරීමකදී හෝ පරිච්ඡින්න කිරීමකදී රීති යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියා මාර්ගයකට අගතියකින් තොරව වීම සංශෝධනය වීම හෝ පරිච්ඡින්න වීම බලපැවැත්විය යුතු ය.

රජයේ නිලධාරියෙකුගේ රාජකාරියට බාධා කිරීම

14. මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද රීතියක සඳහන් විධිවිධාන යටතේ තමන් වෙත සතු වූ හෝ පැවරුණ යම් කාර්යයක් කිරීමේදී හෝ යම් අධිකාරියක් ක්‍රියාවේ යෙදවීමේදී යම් නිලධරයෙකුට හෝ සේවකයෙකුට ඕනෑකමින් බාධා පමුණුවන කවරකු හෝ වරදකට වරදකරු වන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රු. 5,000ට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු වසර එකකට නොවැඩි සිරගත කිරීමකට හෝ ඒ දෙයාකාරයෙන්ම වූ දඬුවමකට යටත් විය යුතු ය.

මාර්ගවලට සිදු කරන හානි සම්බන්ධයෙන් වන වැරදි

15. මෙම වගන්තිය යටතේ සඳහන් පහත සඳහන් කවර හෝ ක්‍රියාවක් සිදු කිරීම වරදක් වන අතර, එවැනි වරදකටම මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරන සෑම තැනැත්තෙක්ම, රුපියල් පන්දහසකට නොඅඩු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ වසරකට නොඅඩු වසර තුනකට නොවැඩි සිර දඬුවමකට හෝ ඒ දෙයාකාරයෙන්ම වූ දඬුවමකට යටත් විය යුතු ය.

(1) යම් මාර්ගයක් හෝ යම් මාර්ගයක කොටසක්, මාර්ග රක්ෂිතයක් සැතපුම් කණුවක්, කිලෝ මීටර් කණුවක්, පහන් කණු, වේලි, පාලම්, තාප්ප, වාහන ගමනාගමනය පාලනය කිරීමේ උපකරණ, වැටවල් හෝ යම් මාර්ගයකට අයත් වෙනත් යම් ඉදිකිරීමක් හෝ අයිතමයක් ඕනෑකමින් විනාශ කිරීම.

(2) යම් මාර්ගයක හෝ මාර්ගය දෙපැත්තෙහි අධ්‍යක්ෂකගේ බලය යටතේ වවා ඇති යම් ගසක්, තණ පිඩලි හෝ ඉදිකර ඇති යම් වැටක් ඉවත් කිරීම හෝ විනාශ කිරීම.

(3) මාර්ගයක් පාවිච්චි කිරීම වැලැක්වීමේ කාර්යය සඳහා හෝ මාර්ගයක් අලුත් වැඩියා කිරීමේදී මාර්ගය පාවිච්චි කරන තැනැත්තන්ට අන්තරායක් හෝ හානි සිදුවීම වැළැක්වීමේ කාර්යය සඳහා තබා ඇති යම් ආරක්ෂක වැටක්, හෝ වෙනත් යම් දෙයක් ඉවත් කිරීම.

(4) පටවන විට හෝ බාන විට හැර යම් මාර්ගයක ලී කඳන්, වැලි, දැව කඳන්, වැලි, ගල් හෝ වෙනත් යම් ද්‍රව්‍ය ඇහිරීම, එක්කාසු කිරීම හෝ ගොඩ ගැසීම.

(5) යම් මාර්ගයක ගල්, වැලි, පස්, තණ පිඩලි හෝ වෙනත් ද්‍රව්‍ය කිසිවක් රැස් කිරීම, එක්කාසු කිරීම.

(6) යම් මාර්ගයකට හානි සිදුවන යම් ආකාරයකින් කවර හෝ ස්වභාවයක යන්ත්‍ර හෝ ද්‍රව්‍ය රැගෙන යාම.

(7) ජලය ගලායාම සඳහා තනන ලද යම් පැති කාණුවක් ඔස්සේ වැසි ජලය ගලායාම හෝ යම් බෝක්කුවකින් හෝ වෙනත් ඉදිකිරීමකින් ජලය පිට වී යාමට බාධා කිරීම.

(8) යම් මාර්ගයක් මත සුලං පුරවන ලද රෝද නොමැතිව, යන්ත්‍රොපකරණ ධාවනය කිරීම.

(9) යම් මාර්ගයකට අයත් යම් වේල්ලක්, අගලක්, කාණුවක් හෝ නළයක් නැතහොත් යම් මාර්ගයක් මත හෝ හරහා හෝ යම් මාර්ගයක් මතුපිට සාදන ලද ජල මාර්ගයක් කඩා දැමීම හෝ නැතහොත් ඒ කිසිවකට හානි සිදු කිරීම.

(10) කවර හෝ කාර්යයක් සඳහා යම් මාර්ගයක් හරහා, ඔස්සේ හෝ යටින් කැනීම් හෝ හැරීම් කිරීම.

(11) යම් බෝක්කුවක් හෝ යම් ඉදි කිරීමක ඇති කුහරයක් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ ලෙස වසා දැමීම හෝ එයට අවහිර කිරීම හෝ පස් පිරවීම මගින් හෝ වෙනත් මාර්ගයකින් පවත්නා මට්ටමකට වැඩි මට්ටමකට, යම් පාලමකට, බෝක්කුවකට හෝ යම් මාර්ගයකට යාබද යම් ඉඩමක් පිරවීම හෝ යම් තැනීමක් ඉදි කිරීම නැතහොත් නිදහසේ ජලය ගලා යාම වැලැක්වීම, ඊට බාධා කිරීම හෝ එය නතර කිරීම පිණිස වෙනත් යම් ක්‍රියාවක් සිදු කිරීම.

(12) අමාත්‍යවරයා විසින් *ගැසට්* නිවේදනය මගින් දක්වා ඇති මාර්ග රක්ෂිත සීමාව තුළ කුමන හෝ අවහිරයක් සිදු කිරීම.

16. (1) මේ ප්‍රඥප්තිය අදාළ වන වැඩ කටයුතු භාරව සිටින නිලධරයන් වෙත මේ ප්‍රඥප්තියෙන් පැවරී ඇති බලතල හා අධිකාර කිසිවක් ක්‍රියාත්මක කිරීම හේතු කොටගෙන යම් පාඩුවක් හෝ අලාභයක් දැරීමට සිදුවන සෑම තැනැත්තෙකුට ඒ සඳහාම වන්දි ලැබීමට හිමිකම් ලැබිය යුතු ය. එසේ වුව ද ඒ අලාභය සිදු වී යයි කියනු ලබන්නේ යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද ඒ ක්‍රියාව, කාරණය හෝ දෙය සිදුවීමෙන් මාස තුනක් ඉකුත් වීමට පෙර කවර හෝ අවස්ථාවක ඒ සඳහා අධ්‍යක්ෂකවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබුවහොත්, උද්දේශිත හානිය සඳහා වන්දි ලබා ගැනීමම පිණිස වූ ඒ ඉල්ලීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය. ඉන් පසු වන්දි අය කර ගැනීමට ඇති අයිතිය ඉල්ලුම්කරුට අහිමි වන්නේ ය. වන්දි ගෙවීම

(2) ඉහත සඳහන් නියමිත කාලය ඇතුළත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති විටක, වන්දි ප්‍රමාණය පිළිබඳව එකඟතාවයකට එළඹිය නොහැකි නම්, ඒ වන්දි ප්‍රමාණ, අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන තවත් බේරුම්කරුවකු හා වන්දි ඉල්ලා සිටින තැනැත්තා විසින් නම් කරනු ලබන තවත් බේරුම්කරුවකු විසින්, තීරණය කරනු ලැබිය හැකිය. බේරුම්කරුවන් දෙදෙනාටම එකඟතාවයකට එළඹීමට නොහැකි වන්නේ නම්, ඔවුන් විසින් තීරකයකු පත් කරනු ලැබිය යුතු අතර, පාර්ශවකරුවන් විසින් එකඟවනු ලබන කොන්දේසි අනුව බේරුම්කරුවන් හෝ තීරක විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

17. මෙම ප්‍රඥප්තියේ I වන වගන්තිය යටතේ සඳහන් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමිත දින සිට උතුරු මැද පළාතේ 1998 අංක 01 දරන පළාත් මාර්ග සංවර්ධන අධිකාර ප්‍රඥප්තිය පරිච්ඡින්න කරනු ලැබේ.

18. (1) නියමිත දිනට පෙරාතුව වූ දිනයකදී උතුරු මැද පළාත් 1998 අංක 01 දරන පළාත් මාර්ග සංවර්ධන අධිකාරය සතුව තිබූ සියළුම චංචල හෝ නිශ්චල දේපළ දෙපාර්තමේන්තුව සතු චංචල හා නිශ්චල දේපළ වශයෙන් ද සියළුම වත්කම් හා බැරකම් දෙපාර්තමේන්තුව සතු වත්කම් හා බැරකම් වශයෙන් ද සැළකිය යුතු ය.

(2) නියමිත දිනට පෙරාතු දිනයේ දී උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හෝ උතුරු මැද පළත් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව අවසන් නොවී පවතින සියළුම නඩු, නීති කෘත්‍ය කාරණා නියමිත දින සිට අධ්‍යක්ෂක විසින් හෝ අධ්‍යක්ෂකට එරෙහිව පවරනු ලැබූ නඩු, නීති කෘත්‍ය කාරණා වශයෙන් ද නියමිත දිනයට පෙරාතුව උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් දෙන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රධානයක් නියමිත දින සිට අධ්‍යක්ෂකට අදළව ලබා දෙන ලද තීන්දු ප්‍රකාශයක්, නියෝගයක් හෝ ප්‍රදනයක් වශයෙන් සැළකිය යුතු ය.

19. (1) නියමිත දිනට පෙරාතුව ම දිනයේ උතුරු මැද පළතේ මාර්ග සංවර්ධන අධිකාරියෙහි ස්ථිර තනතුරක් දරන නිලධරයන් හෝ සේවකයන් නියමිත දිනයේ සිට 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරු දරන දෙපාර්තමේන්තුවේ නිලයන් හා සේවකයින් වශයෙන් සැළකිය යුතු ය.

(2) නියමිත දිනයේ දී ඉහත (අ) උප වගන්තිය යටතේ උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයට ඇතුළත් වීමට අකමැත්තක් ඇති යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු නියමිත දිනයට පූර්ව දිනයේ උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තමන් දරූ තනතුරට අදළ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ හිමිකම් හා වරප්‍රසාද සහිතව සේවයෙන් ඉවත් වීමට ඉඩ ලබා දිය යුතු ය.

(3) මෙම ප්‍රඥප්තියේ යටතේ උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවය යටතට ගැනෙන සේවකයින් හා නිලධරයන් සම්බන්ධයෙන් උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ කොන්දේසි හා නියමයන්, එම සේවකයින් නිලධාරීන් නියමිත දිනට පූර්වයෙන් වූ උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි ස්ථිර සේවා කාලයද පදනම් කරගනිමින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තියෙහි විධිවිධානයන්ට අනුව තීරණය කළ යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ වන කාර්යය පටිපාටිය විධිමත් කිරීම අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ 13 වන වගන්තිය යටතේ පනවනු ලබන රීති මගින් සිදු කළ යුතු ය.

20. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස

''පළාත'' යන්නේ උතුරු මැද පළාත ද,
''පළාත් සභාව'' යන්නෙන් උතුරු මැද පළාතේ පළාත් සභාව ද,
''ප්‍රධාන අමාත්‍යවරයා'' යන්නෙන් උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ද,
''අමාත්‍යවරයා'' යන්නෙන් උතුරු මැද පළාතේ මාර්ග විෂයභාර අමාත්‍යවරයා ද,
''ලේකම්'' යන්නෙන් උතුරු මැද පළාතේ මාර්ග විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ද,
''මාර්ගය'' යන්නෙන් මහ මාර්ග ආඥපනතේ ඊට අදාළව දී ඇති අර්ථයම ද,
''මාර්ග රක්ෂිතය'' යන්නෙන් යම් මාර්ගයක ආරක්ෂාව සුරක්ෂිත බව හා එහි සුබසිද්ධිය පිණිස අනාගත සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබ ඇති මාර්ගයට හෝ මාර්ගයේ දෙපස කාණු වලට යාබදව පිටතින් පිහිටා ඇති ඉඩම් කොටස් ද,
''මාර්ග සංවර්ධනය'' යන්නෙන් අලුතින් මාර්ගයක් ඉදිකිරීම, පවත්නා කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ වැඩි දියුණු කිරීම, කිසියම් මාර්ගයක් පුළුල් කිරීම, කිසියම් මාර්ගයක් මට්ටම් කිරීම, පදිකයින්ගේ ප්‍රයෝජනය පිණිස පදික වේදිකා සැපයීම, දූවිලි වලින් ඇති වන හිරිහැරය අඩු කිරීම සඳහා ප්‍රතිකර්ම යෙදීම, ගස් රෝපණය හා තණකොළ තීරු ඇති කිරීම, හා පළාත තුළ පිහිටි මාර්ගයක සිදු කරන වෙනත් අන්දමේ අලුත්වැඩියාවන්ද ඇතුළත් වේ.

21. ප්‍රඥප්තියේ සිංහල හා ඉංග්‍රීසි පිටපත් අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පිටපත වලංගු සේ සැලකිය යුතු ය.

04-346

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.